




සිසිර දිසානායක

# තාත්තලාගේ දවස

"හුර්රේ....හ්..........!"

"අද අපේ දවස !! තාත්තා මට ඇනපු ටොක්ක ........."

අල්ලපු ගෙදර ලොකු සාදයක්. තාත්තලාගේ දවසේ තාත්තලා ටිකක් එකතුවෙලා. පන්හිඳ කලින්ම නින්දට ගිය හින්ද හොඳටම නින්ද ගිහින්. ඒත් පින්සලට එහා ගෙදර ගාල ගෝට්ටිය හන්ද නින්ද ගියේ නෑ.

"ඉස්කෝලෙ යන කාලෙම යාළු වුණ කෙල්ලෝ "බුටි" තියපු හන්ද බඳින් එකත් එපා වුණා. ඒ හන්ද අපට තාත්තලා වෙන්නත් බැරි වුණා...." පින් තමුන්ට ම කියා ගත්තා. "මොනවා හරි ලියන්න ඕනේ" පින් පන්හිඳගේ මේසේ වාඩිවෙලා කොලේකුයි පෑනකුයි හොයාගත්තා. "මොකද පන්ට විතර ද පුලුවන් ලියන්න. මෙද පාර මම යි ලියන්නේ " සන්නසට".

"මේ තාත්තලා කියන කට්ටිය නම් මහ පුදුම කට්ටියක් ය....." පින්සල ලියන්න ගත්තා.

"ප්‍රේමවන්තයින් විවාහ වුණ ද ඉඳන් සැමියන් වෙනවාය. සැමියෙක් බිරින්දවරුන්ට දරු-වෝ ලැබුණ ද ඉඳන් තාත්තලා වෙනවාය. හැමදමත් විවාහය රැකගන්න, පවුල රැකගන්න දර දිය අදිනවාය. "සුමේ" කරනවාය. සල්ලි හම්බකරන්න රස්සා කරනවාය. පවුල ආරස්සා කරනවාය."

දරුවෙකු මව් කුසයට ආ ද පටන් ඕනෑ එපාකම් පිරිමහිනවාය. එහේ දුවනවාය; මෙහේ දුවනවාය. ඉල්ලන ඉල්ලන දේ හොයලා දෙනවාය. කියන කියන දේ කරනවාය. දෙළ දුක් සංසිඳවනවාය. බිරින්දෑ තමුන්ගේ ගෙදර යන්න ඕනෑය කිව්වොත් එහේ යනවාය. ඒ දරුවෙක් ලැබෙන්න ඉන්න බිරිඳෑව සනසන්නටය. නැන්දම්මා - මාමා ඇතුලු ඒ පැත්තේ උදවියගෙන් ලැබෙන උදව් ද ගන්නවාය. තවත් ඔලුවේ කැක්කුම් ද ගන්නවාය.

දරුවා ලැබෙනකල්ම නිදිමරනවාය. ලැබුණාට පස්සේත් නිදිමරණවාය. නිදිමරලා පහුවද වැඩටත් යනවාය. ඉපදුනාම දරුවෙකු දෙන්නේ තාත්තා අතටය. කවදවත් දරුවෙකු වඩාගෙන නැති තාත්තා කෙනෙකු දරුවන් වඩාගන්නේ නුහුරටය. තමුන්ගේ ලෙයින් මසින් හැදිච්ච එකෙක් නේ දැයි කඳුළු පිහිනවාය. දරුවා නළවනවාය. දරුවාගේ උණුහුම විඳිනවාය. අම්මා දරුවාට කිරි දෙනකල් ඒ දිහා බලා නොහිට අඩු වැඩිය හොයන්න දුවනවාය. පිටිකිරි එකතු කරනවාය. විටමින් හොයනවාය. දෙස්තරලා පස්සේ දුවනවාය. දරුවාගේත් අම්මාගේත් ලෙඩ දුකට බලනවාය.



තාත්තලා නම් පුදුමාකාරයා. "දරුවා අම්මා වගේමයි" කියද්දීත් ඔහේ හිනාවෙනවාය. " ඒක හොඳයි" කියලා හිතනවාය. ඒ තමුන් කැතයි කියන හිතන හන්දය. නෝනා ලස්සනයි කියලා හිතන හන්දය. බිරින්දෑ තමුන්ව ගණං නොගෙන දරුවා මත්තෙම නැහෙද්දීත් තමුන් බිරින්දත්, දරුවාත් මත්තේ නැහෙනවාය. රස්සාවට යන්නේත් නැතිව ඒ වෙනුවෙන් කැප වෙනවාය.

යන - එන හැම තැනදීම දරුවාටත්, බිරිඳටත් මුල් තැන ලැබෙද්දී තාත්තලාත් ඒ අයටම මුල් තැන දීලා නිකං ඉන්නවාය. ඉරිසියාවක්, කුහක කමක් නම් ඇත්තේම නැතුවා වාගේය. තිබුණත් ඒවා යටකරගෙන දරු සෙනෙහසම මතු වෙනවා වාගේය. මට නම් මේ ගැන මෙලෝ දෙයක් තේරෙන්නේ නැතිවාය. එදිරිවීර සරච්චන්ද්‍ර මහත්තයාගේ "සිංහ බාහු" නාට්ටිය බලපු ද නම් මොකක්දේ දෙයක් දැනුණාය.

දරුවා උපන් ද පටන් හඳහන් බලනවාය. ඉස්කෝල හොයනවාය. පදිංචි මාරු කරනවාය. අළුතෙන් ගෙවල් හදනවාය. ඒ ඉස්කෝල වලට උදව් කරනවාය. මොන්ටිසෙ-ෆ්රි හොයනවාය. සායන වලට දරුවවත් අම්මාවත් අරගෙන යනවාය. රස ගුණ කෑම හොයනවාය. බලන්න එන නෑ හිතවතුන්ට සංග්‍රහ කරනවාය. තමනුත් ඒවායින් ටිකක් වෙන්න බුක්ති විඳිනවාය. වැඩිපුර බුක්ති වින්ද දට බැණුනුත් අහගන්නවාය.

දරුවා ඉස්කෝලෙකට ද පු ද ඉඳලා තාත්තලා ඒ පස්සෙන්මය. අමතර පන්තිද, ක්‍රීඩා ද, අරකද මේක ද හැම එකක්ම හොය හොයා ගෙනියනවාය. ඒ පස්සෙම වැටිලා ඉන්නවාය. තමුන්ට ජීවිතේටම කරගන්න බැරි වුණ දේවලුත් දරුවා ලවා කරවාගන්න බලනවාය. මේ රටේ දී නම් වැඩේම වාහනේ අරං එහේ මෙහේ දුවන එකය. හරියට රස්සාව ඒක වාගේය. ඔය අතරේ යාලු මිත්‍ර සමාගමේ ද යනවාය. සමාජ සේවෙට ද යනවාය. ගිහින් ගෙදරින් බැණුම් අහගන්නවාය.

ගෙදර තීරණ ගන්නේ බිරිඳ වුණත් ඒවා තමන්ගේ තීරණ වගේ අඟවනවාය. ඒවාට එකඟ වෙනවාය. දුන්නු දෙයක් කාලා ඇඳලා සැනසෙනවාය. තමං කැමති දේවල් ගැන හීන බල බලා ඉන්නවාය. ඒවා ඉල්ලන්නේවත්, ගන්නේවත් නැතිය. දරුවන් ඉල්ලන දේ අරගෙන දෙනවාය. තමනුත් යමක් හරි හම්බකරන බව තමුන්ට ම අමතක වෙනවාය.

දරුවෝ දීග දෙන කාලෙට හඳහන් මදිවාට පොරොන්දනුත් බලනවාය. අන්තිමේ ගලපා ගන්න බැරිව ළතවෙනවාය. ඒ වුණාට දරුවන් උන් කැමති අය එක්ක යනවාය. මුණුපුරු මිණිපිරියෝ අරගෙන ආයෙ එනවාය. තාත්තලා ඒ ආවාම දරුවන්ව ආදරයෙන් පිළිගන්නවාය. දරුවෝ තමුන්නේ දරුවන්ව බලාගන්න අම්මලා එක්කරගෙන ගියාම තාත්තලා තනිවෙනවාය.

තාත්තලා ගැන ලියන්නට කියන්නට කෙනෙක් නැතිය. ඒ කාටවත් අගයක් නැති හින්දය. කොයි තරං අම්මලා ගැන සින්දු තිබුණත් තාත්තලා ගැන ලියලා තියෙන්නේ දෙකක් තුනක් විතරක්ය. ටී. එම්. ජයරත්න මහත්තයාට මාලනී ජයරත්න බිරින්දෑ ලියා දුන්න සින්දුවේත් මුලට "අම්මා සඳකි..." කියලා ලියලා තමංගේ පංගුව මුලටම තියාගෙනය. ඉතින් අපේ ගුවන් විදුලි කට්ටිය ඒක මව් ගුණ ගීයක් කියලා හිතලා ඒකත් මව්වරුන්ගේ දිනයටම ප්‍රචාරය කරනවාය. තාත්තා ගැන ඇඳපු චිත්‍රයක් මම නං දැකලා නැතිවාය. කවි නං තියෙනවාය. පන්හිඳත් මොනවාදේ ලිව්වාය. ඒත් ඒවා කවුරුත් ගණං ගන්නේ නැතිය.

මේවා උහුලාගන්න බැරි තාත්තලා නං දික්කස-ාදත් වෙනවාය. අනිත් අය දුක යන්නත් එක්ක තාත්තලාගේ දවස ඉහළින්ම සමරනවාය. වැඩිපුර සමරන දට සමහර තාත්තලා වැඩිපුර කපාගෙන තියෙන ගෙදර දෙරේ යතුර සාක්කුවේ දාගෙන එන්න අමතක කරන්නේ නැතිවාය. වයසට යනකොට වෙනම කාමරයක නිදගන්නේ ද නිදහස ගැන හිතලා ද කො-හේදය.

ඉතින් ඔය විදියට බලාගෙන යනකොට තාත්තලා කියන්නේ නම් අපුරු කට්ටියක් ම තමාය..." පින් ලියවිල්ල ඉවර කරලා නිදගන්න ඇඳට වැටුණා. අල්ලපු ගෙදර තාත්තලාගේ දවසේ සාදය එළිවෙනකල් ම ගියා.

තමුන්ගේ මෙසේ උඩ තියෙන පින්ගේ ලියවිල්ල පහුවද උදේට අවදිවුන පන් දැක්කා.

"සන්නසට යවන්නයි ලියල තියෙන්නේ. ඒත් පත්තරේක දන්න පුලුවන් ලිපියක් ද මේ ?" පින් තමුන්ටම කියා ගත්තා.

"කරන්න දෙයක් නෑ. මටත් දැන් ලිපියක් ලියන්න වෙලාවක් නෑ. මේකවත් මෙදපාර " පන් ලියවිල්ල කවරෙක දාලා අසෝක සුබසිංහ මහත්තයාගේ ලිපිනය ලිව්වා.





LAND FOR SALE IN SRI LANKA
ETHULKOTTE - MALIGAWA ROAD

50 meters to Ethulkotte - Nugegoda Road
Ideal residential property
20 perches - Rs. 2.2 million per perch
Price negotiable

Contact : 0448 756 944 / 02 9476 3606